*සැ. යු.* - 2021.04.01 වැනි දින අංක 2222 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,223 - 2021 අප්‍රේල් මස 09 වැනි සිකුරාදා - 2021.04.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 100 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 103 |


සැ. යු. -(i) එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2021 මාර්තු මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2021 මාර්තු මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත් කෙටුම්පත 2021 මාර්තු මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 අප්‍රේල් මස 30 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අප්‍රේල් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

99 -B 82220 - 352 (2021/03)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඒ. ඒ. විදුර සම්පත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1990 අගෝස්තු 07 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/මආඡ/75 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මාගස්තොට නුවරඑළිය පදිංචි පල්ලේගෙදර ගම්මැහේලාගේ සුගතදාස වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/18/233/90 අංක යටතේ 1990.08.13 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.04.30 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔය පළාත, පත්තුවේ/කෝරළේ 535 ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මාගස්තොට නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, නුවරඑළිය සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත ............ දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මූ. පි. නු. 1008 දරන කට්ටි කැබීමේ පිඹුරේ විසින් සම්පාදිත ............ අංක දරන රේඛා සටහනේ 25 අංක දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.069 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : මාර්ගය සහ කැබලි අංක 24 ,
*නැගෙනහිරට* : පැල ඉඹි වැට (මාර්ගය) ,
*දකුණට* : මාර්ගය,
*බස්නාහිරට* : මාර්ගය.

ඒ. ඒ. විදුර සම්පත්,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2020 නොවැම්බර් මස 28 වැනි දින.

04-195

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ජහුෆර්දීන් රලියුදීන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1987.01.28 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර/18733 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු පදවි පරාක්‍රමපුර දකුණ පදිංචි හේරත් මුදියන්සේලාගේ සෝමදාස වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පත් ඉරු අංක 301/190 යටතේ 1998.05.25 වැනි දින ලියාදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.04.30 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාසයේ, උතුරු හුරුළු පත්තුවේ/කෝරළේ 31 ඒ ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ පදවි පරාක්‍රමපුර දකුණ නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ............ භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක ----- දරන ක්ෂේත්‍ර පතෙහි ......... විසින් සම්පාදිත අංක ටී. පී. පී. 20 දරන කට්ටි කැඞීමේ පිඹුරේ ......... විසින් සම්පාදිත අංක ......... දරන රේඛා සටහනේ අංක 2915 දරන බිම කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 0 රූඩ් 03 පර්චස් 37 (තිස්හත) ක් විශාලත්වය ඇත්තාවූ ද පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය : ගොඩ ඉඩම.

*උතුරට* : කැබලි අංක 2921,
*නැගෙනහිරට* : කැබලි අංක 2916,
*දකුණට* : කැබලි අංක 2906,
*බස්නාහිරට* : කැබලි අංක 2914.

ජේ. රලියුදීන්,
ප්‍රාදේශීය ලේකම්,
පදවිය.

2020 නොවැම්බර් මස 19 වැනි දින.

04-194/1

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ජහුෆර්දීන් රලියුදීන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1986.08.25 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර/11912 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු පදවි පරාක්‍රමපුර දකුණ පදිංචි අලුත් ගමරාළලාගේ සුභසිංහ වෙත ප්‍රදනය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පත් ඉරු අංක 15/18 යටතේ 1987.08.20 වැනි දින ලියාදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.04.30 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාසයේ, උතුරු හුරුළු පත්තුවේ/කෝරළේ 31 ඒ ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ පදවි පරාක්‍රමපුර දකුණ නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ............ භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක ----- දරන ක්ෂේත්‍ර පතෙහි ......... විසින් සම්පාදිත අංක ටී. පී. පී. 20 දරන කට්ටි කැඩීමේ පිඹුරේ ......... විසින් සම්පාදිත අංක ......... දරන රේඛා සටහනේ අංක 1687 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 01 (එකයි) රූඩ් 00 (නැත) පර්චස් 03 (තුන) ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත සඳහන් පරිදි මායිම වූ රජයේ ඉඩම් කට්ටිය : ගොඩ ඉඩම.

*උතුරට* : කැබලි අංක 1688,
*නැගෙනහිරට* : කැබලි අංක 1689,
*දකුණට* : කැබලි අංක 1688,
*බස්නාහිරට* : කැබලි අංක 1688.

ජේ. රලියුදීන්,
ප්‍රාදේශීය ලේකම්,
පදවිය.

2020 සැප්තැම්බර් මස 23 වැනි දින.

04-194/2

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ජහුෆර්දීන් රලියුදීන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1986.07.21 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර/11742 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු පදවි පරාක්‍රමපුර දකුණ පදිංචි අලුත් ගමරාළලාගේ සුභසිංහ වෙත ප්‍රදනය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පත් ඉරු අංක 13/4576 යටතේ 1987.03.03 වැනි දින ලියාදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.04.30 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

උතුරු මැද පලාතේ, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ උතුරු හුරුළු පළාත දනේ පදවිය ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාසයේ, උතුරු හුරුළු පත්තුවේ/කෝරළේ 31 ඒ ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ දකුණු පදවි පරාක්‍රමපුර නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ............ භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක ----- දරන ක්ෂේත්‍ර පතෙහි ......... විසින් සම්පාදිත අංක ටී. පී. පී. 20 දරන කට්ටි කැඩීමේ පිඹුරේ ......... විසින් සම්පාදිත අංක ......... දරන රේඛා සටහනේ අංක 2135 දරන බිම කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 03 රූඩ් 00 පර්චස් 34 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත සඳහන් පරිදි මායිම වූ රජයේ ඉඩම් කට්ටිය : කුඹුරු ඉඩම.

*උතුරට* : කැබලි අංක 2134,
*නැගෙනහිරට* : කැබලි අංක 2136,
*දකුණට* : කැබලි අංක 2035,
*බස්නාහිරට* : කැබලි අංක 2129.

ජේ. රලියුදීන්,
ප්‍රාදේශීය ලේකම්,
පදවිය.

2020 සැප්තැම්බර් මස 23 වැනි දින.

04-194/3

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් පිහිලිඇලේ ගෙදර සුනිල් අබේකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1982.06.23 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර/2539 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රාජාංගනය, දකුණු ඉවුර, යාය 13 පදිංචි නාගහවත්ත ආරච්චිගේ දෙන් හෙන්ද්‍රික් අප්පුහාමි මහතා වෙත ප්‍රදනය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 2606 යටතේ 1982.08.23 වැනි දින ලියාදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.04.30 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

උතුරු මැද පලාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ බටහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, දකුණු විලච්චි කෝරළයේ 5 බී ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ රාජාංගනය, දකුණු ඉවුර, යාය 13 නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක 01 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ජ. සි. අ. 12 දරන පිඹුරෙහි අංක 08 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති, ප්‍රමාණයෙන් අක්කර දෙකයි පර්චස් දහඅටක් ඇතැයි ගණන් බලා තිබෙන රාජාංගන කුඹුර යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

| | |
|---|---|
| *උතුරට* | : අංක 07 කුඹුරු ඉඩම හා අංක 10 පනක්කානි කෙත් ඇල රක්ෂිතය, |
| *නැගෙනහිරට* | : අංක අංක 10 පනන්කානි ඇල රක්ෂිතය, |
| *දකුණට* | : අංක 09 කුඹුරු ඉඩම හා අංක 43 කෙත් ඇල රක්ෂිතය, |
| *බස්නාහිරට* | : අංක 07 කුඹුරු ඉඩම හා අංක 43 කෙත් ඇල රක්ෂිතය. |

පී. ජී. සුනිල් අබේකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2020 දෙසැම්බර් මස 21 වැනි දින.

04-194/4

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් පී. ජී. සුනිල් අබේකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1999.06.07 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/රාජා/ප්‍ර/3950 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රාජාංගනය, යාය 06 පදිංචි දිසානායක මුදියන්සේලාගේ සෝමපාල වෙත ප්‍රදනය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1007යටතේ 2000.02.07 වැනි දින 373/152 පිටුවේ ලියාදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.04.30 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එප්පාවල කෝරළයේ 448 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ යාය 06 නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 16 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ග. සි. 439 දරන රේඛා සටහනේ අංක 741 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.383 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : (ගොඩ)

| | |
|---|---|
| *උතුරට* | : අංක 738 ගොඩ ඉඩම, |
| *නැගෙනහිරට* | : අංක 739 ජනපද පාර රක්ෂිතය, 770 ඉඩම, |
| *දකුණට* | : අංක 770 බිම් කැබැල්ල, |
| *බස්නාහිරට* | : අංක 730 ජනපද පාර රක්ෂිතය. |

පී. ජී. සුනිල් අබේකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2021 මාර්තු මස 03 වැනි දින.

04-194/5

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/62743.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
පළාත්/ඉකො/ඉ9/ගල්/දී.බ. 15.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 70, කට්ටකඩුව ග්‍රාම නිලධාරි වසමේ ගනේදිවුල්වැව ගමේ පිහිටි අ. ග. පි. 3245 හි කැබලි අංක 71 ප්‍රමාණයෙන් හෙක්. 0.0608 ක් විශාල වූ ඉඩම් කොටස ආගමික කටයුතු සඳහා අල් ෆලාහ් ජුම්මා පල්ලියේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 70 සහ 72 වැනි බිම් කැබැල්ල, |
| *නැගෙනහිරට* | : | අංක 72 දරන බිම් කැබැල්ල, |
| *දකුණට* | : | අංක 72 දරන බිම් කැබැල්ල, |
| *බටහිරට* | : | අංක 72 වැනි බිම් කැබැල්ල. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන, එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය*.- අවුරුදු තිහයි (අවු. 30) (2020.07.15 දින සිට ඉදිරියට)

*(ආ)* *වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, ගරු ඇමතිතුමා අනුමත කළ 2020 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2%කි.

*(ඇ)* වාර මුදල. - නැත.

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම පල්ලිය පවත්වාගෙන යාම සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඉ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඌ)* 2020.07.15 දින සිට වසර 05ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(එ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඒ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්ලිව්. කේ. එන්. නයෝමි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 අප්‍රේල් මස 09 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 1200/6,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-292

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/64008.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NWP/PLC/L9/WW/
LTL/29.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

පුත්තලම දිස්ත්‍රික්කයේ, වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 636/1, වනාතවිල්ලුව දකුණ ග්‍රාම නිලධාරි වසමේ වනාතවිල්ලුව ගමේ, රජයේ මිනින්දෝරු ඩබ්. සී. එම්. ප්‍රනාන්දු මහතා විසින් මැන අඳින ලද අංක පු/වනා/2018/01 දරන අනුරේඛනයේ කැබලි අංක ''ආ'' හි ප්‍රමාණයෙන් අක්කර 8 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා දිසානායක මුදියන්සේලාගේ සිරිවර්ධන මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*කැබලි අංක ''ආ''*

| | | |
|---|---|---|
| *උතුරට* | : | මූලික පිඹුරු A 1710 හි කැබලි අංක 215 හා මාර්ගය, |
| *නැගෙනහිරට* | : | මාර්ගය හා මූලික පිඹුරු A 1710 හි කැබලි අංක 215, |

*දකුණට* : මූලික පිඹුරු 4743 හි කැබලි අංක 01 හා මූලික පිඹුරු A 1710 හි කැබලි අංක 215,
*බටහිරට* : මූලික පිඹුරු A 1710 හි කැබලි අංක 215.

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන, එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය*.- අවුරුදු තිහයි (30) (2021.02.15 දින සිට ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2021 වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ මුදලින් 50% කට නොවැඩි විය යුතු ය.

*වාර මුදල*. - වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.
*දඩ මුදල* .- 2021 වර්ෂයේ ඉඩමේ නොදියුණු වාණිජ වටිනාකමින් 10%කි.

(ඇ) මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

(ඉ) පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඊ) සාදා ඇති ගොඩනැගිලි/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(ඌ) 2021.02.15 සිට වසර 05ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඒ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. එම්. යූ. පී. කේ. උඩගෙදර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2021 අප්‍රේල් මස 09 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර''
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-191

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/52587.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : පළාත්/ඉකො/ඉ 9/මුන්/දී. බ. 07.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කුඩිරිප්පුව ග්‍රාම නිලධාරි වසමේ මුන්දලම ගමේ, රජයේ මිනින්දෝරු මහතා මැන සැකසූ පු/මුන්/2016/28 දරන අනුරේඛනයේ කැබලි අංක ''අ'' ප්‍රමාණයෙන් හෙක්ටයාර් 7.4445 (අක්. 18, රූඩ් 01, පර්. 23) ක් වූ රජයේ ඉඩම් කොටස ඉස්සන් වගා ව්‍යාපෘතියක් සඳහා හීකියනගේ රන්ජිත් බැසිල් ප්‍රනාන්දු මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*කැබලි අංක ''අ''*
*උතුරට* : වගුර සහ ඉස්සන් ගොවිපල රජය,
*නැගෙනහිරට* : ඉස්සන් ගොවිපල රජය,
*දකුණට* : මුන්දලම කලපු රක්ෂිතය,
*බටහිරට* : මුන්දලම කලපු රක්ෂිතය.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන, එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය*.- අවුරුදු තිහයි (30) (2021.02.22 දින සිට ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2021 වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ මුදලින් 50% කට නොවැඩි විය යුතු ය.

*වාර මුදල.* - වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.
*දඩ මුදල* .- 2021 වර්ෂයේ ඉඩමේ නොදියුණු වාණිජ වටිනාකමින් 10%කි.

(ඇ) මෙම ඉඩම ඉස්සන් වගා ව්‍යාපෘතියක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

(ඉ) පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඊ) සාදා ඇති ගොඩනැගිලි/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(ඌ) 2021.02.22 සිට වසර 05ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඍ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. එම්. යූ. පී. කේ. උඩගෙදර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 අප්‍රේල් මස 09 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර''
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-192

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/58799.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : UPLC/L/12/up/L/18.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

බදුල්ල දිස්ත්‍රික්කයේ, ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 47 ඒ අඹගස්දෝව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ B/UVP/2016/184 අනුරේඛනයේ කැබලි අංක ඒ වන බිම් කැබැල්ල ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0516 ක් වාණිජ කටයුතු සඳහා ඌව පරණගම ප්‍රාදේශීය සංවර්ධන බැංකුව නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ. ග. පි. 38 හි කැබලි අංක 420, 194, |
| *නැගෙනහිරට* | : | අ. ග. පි. 38 හි කැබලි අංක 194 සහ $18C^1$, |
| *දකුණට* | : | අ. ග. පි. 38 හි කැබලි අංක $18C^1$ සහ 411, |
| *බටහිරට* | : | අ. ග. පි. 38 හි කැබලි අංක 411 සහ 420. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන, එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2020.09.12 දින සිට 2050.09.11 දක්වා)

(ආ) *වාර්ෂික බදු මුදල.*- 2020 වර්ෂයේ පවතින ගොඩනැගිලි වල හා ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. 2020 වර්ෂයේ පවතින ගොඩනැගිලි වල හා ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000)ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

වාර මුදල. - වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2020.09.12 දින සිට අවුරුදු 05ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය පළ කරන දින සිට* සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එම්. එල්. ඒ. සංජීව,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 අප්‍රේල් මස 09 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-193

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/61850.
ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්)ගේ අංකය : අම්/අපනයන බෝග /01.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සද්ධාතිස්සපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සද්ධාතිස්සපුර ගමේ කඩයිම් සිතියම් 280002 හි කැබලි අංක 609 610, 611, 612, 613 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1881 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ල කෘෂිකාර්මික පදනමින් අපනයන බෝග පැළ තවාන් කරුවන්ගේ සංගමය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*කැබලි අංක 609*
*උතුරට* : කැබලි අංක 425 සහ 224,
*නැගෙනහිරට* : කැබලි අංක 224 සහ 614,
*දකුණට* : කැබලි අංක 614 සහ 610,
*බටහිරට* : කැබලි අංක 610 සහ 425.

*කැබලි අංක 610*
*උතුරට* : කැබලි අංක 425 සහ 609,
*නැගෙනහිරට* : කැබලි අංක 609 සහ 614,
*දකුණට* : කැබලි අංක 614 සහ 611,
*බටහිරට* : කැබලි අංක 611 සහ 425.

*කැබලි අංක 611*
*උතුරට* : කැබලි අංක 425 සහ 610,
*නැගෙනහිරට* : කැබලි අංක 610 සහ 614,
*දකුණට* : කැබලි අංක 614 සහ 612,
*බටහිරට* : කැබලි අංක 612 සහ 425.

*කැබලි අංක 612*
*උතුරට* : කැබලි අංක 425 සහ 611,
*නැගෙනහිරට* : කැබලි අංක 611 සහ 614,
*දකුණට* : කැබලි අංක 614 සහ 613,
*බටහිරට* : කැබලි අංක 613 සහ 425.

*කැබලි අංක 613*
*උතුරට* : කැබලි අංක 425 සහ 612,
*නැගෙනහිරට* : කැබලි අංක 612 සහ 614,
*දකුණට* : කැබලි අංක 614 සහ 425,
*බටහිරට* : කැබලි අංක 425.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන, එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (ගරු ඇමතිතුමා අනුමත කළ 2020.07.08 දින සිට ඉදිරියට)

*(ආ)* *වාර්ෂික බදු මුදල*.- 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000)ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

වාර මුදල. - වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඇ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්)/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* බද්ද ක්‍රියාත්මක වන දින සිට වසර 05ක් ගත වන තුරු අතුරුබදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

සමීර පී. හෙට්ටි ආරච්චි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 අප්‍රේල් මස 09 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-241

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.